*Archaeologia (2004) : 37 - 55*

# ඉතිහාසය සකස් කිරීමේ දී දීපවංසයෙහි ඇති විශ්වසනීයත්වය

**නදීෂා ෂර්මලී ගුණවර්ධන**
ඉතිහාස අධ්‍යයන අංශය,කැලණිය විශ්වවිද්‍යාලය
e-mail: nadee@kln.ac.lk

## හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ඓතිහාසික පුරාවෘත්ත වර්ධනයේ ප්‍රාථමික අවස්ථාවේ දී දීපවංසය රචනා විය. අඥාත කතෘක දීපවංසය කතුවරයා දුරු උත්සහය, මහාවංසය ඇතුළු සෙසු වංසකථාකරණයට ද හේතුකාරක වූවාට නිසැක ය. දීපවංසයෙහි මහසෙන් රජු ගැන සඳහන් වන නිසාත් බුද්ධඝෝෂ අටුවාචාරීන් වහන්සේ විසින් රචිත සමන්තපාසාදිකාවෙහි ද දීපවංසය පිළිබඳ සඳහන්වන නිසාත්, මහසෙන් කාලයටත් (ක්‍රි.ව. 276-303) හෙළටුවා පාලියට පෙරළීමටත් (ක්‍රි.ව. 4-5) අතරතුර කාලයේදී දීපවංසය රචනා කරන්නට ඇතැයි බොහෝ දුරට සිතිය හැකිය. මේ සම්බන්ධයෙන් අදහස් දක්වන මහාචාර්ය එස්. බී. හෙට්ටිආරච්චි මහතා මහාවංසය රචනා කිරීමට පෙර එනම් ක්‍රි.ව. 5 සියවස දක්වා වූ කාලයේ දී දීපවංසය රචනාවන්නට ඇතැයි අදහස් පළ කරයි.මෙම ලිපියේ අරමුණ වන්නේ ඉතිහාසය සකස් කිරීමේ දී දීපවංසයේ ඇති විශ්වසනීයත්වය විමසා බැලීමයි.

## වංසකථා සම්ප්‍රදාය

දැනට අවශිෂ්ටව පවත්නා ලංකාවේ දී සැලසුම් කරන ලද ථෙරවාදී සම්ප්‍රදායේ අදිතම වංසකථාව දීපවංසය බව සාම්ප්‍රදායික පිළිගැනීම වේ. නමුත් ඊට පෙරාතුව සීහළවත්ථුප්පකරණය නම් කෘතිය රචනා කරන ලදැයි මතයක් ද ප්‍රකාශ වී තිබේ. (විමලකිත්ති 1962, 4-5). සීහලවත්ථුප්පකරණයට අන්තර්ගත වනුයේ ශ්‍රී ලංකාවේ විවිධ පළාත්වල සිදු වූ ප්‍රවෘත්ති ලේඛනාකරගත් කථා හැත්තෑතුනක් හා ඉන්දිය කථාවස්තු නවයකි. මෙහි කර්තෘ කණ්ටකරසොල පට්ටනයේ පිහිටියා වූ පට්ටිකොට්ටි විහාරයේ වැඩවාසය කළ ධම්මනන්දි නම් භික්ෂුවකි. මෙම සීහලවත්ථුප්පකරණය දීපවංසයට වඩා පැරණි ද (විමලකිත්ති 1962, 5) යන ප්‍රශ්නය කෙරෙහි අවධානය යොමු කරන හේම එල්ලාවල මහතා දකුණු ඉන්දියාවේ නාගර්ජුනකොණ්ඩ දේශයෙන් ලැබෙන සෙල්ලිපියක සඳහන් සීහලවිහාරය සීහලවත්ථුප්පකරණය රචනා කළ ධම්මනන්දි හිමියන් වැඩ සිටි පට්ටිකොට්ටි විහාරය බවත් පවසයි (විමලකිත්ති 1962,